# කන්‍යා මරියාවන්ගේ උත්පත්තිය
## මංගල්‍යය

## පළමුවන දේව ප්‍රකාශනය මීකා 5: 1 – 5

*මීකා දිවැසිවරයාගේ පොතෙන් උපටා ගත් කොටසකි.*

"ඉශ්රායෙල් කෙරෙහි අධිපතියා වීමට කෙනෙක් තී කෙරෙන් නැගී එන්නේ ය."

හමුදා රැස් කරන්න. සතුරෝ ජෙරුසලම වටලාගෙන සිටිති. ඉශ්රායෙල්හි නායකයන්ට ඔව්හු කෙවිටකින් පහර දෙති. "එම්බා බෙත්ලෙහෙම් එප්‍රාතා! තී ජුදාහි ගෝත්‍රවලින් ඉතා අල්ප වන්නෙහි ය. එහෙත්, ඉශ්රායෙල් කෙරෙහි අධිපතියා වීමට කෙනෙක් තී කෙරෙන් නැගී එන්නේ ය. එතුමන්ගේ පෙළපතේ මුල දුරාතීතයෙන් ද පැරණි යුගයෙන් ද එන්නකි." එබැවින් ගැබ්ගෙන සිටින ස්ත්‍රිය දරුවෙකු බිහි කරන තෙක් සමිඳාණන් වහන්සේ සිය සෙනඟ සතුරන්ට පාවා දෙන සේක. එවිට ඔවුන්ගේ සහෝදරයන්ගෙන් ඉතිරි කුඩා පිරිස ඔවුන්ගේ සෙනඟ සමඟ එක් වන්නෝ ය.

එතුමන් පැමිණි විට, සමිඳාණන් ලැබෙන ශක්තියෙන් ද දෙවි සමිඳාණන් වහන්සේගේ නාමයේ මහිමයෙන් ද සිය සෙනඟ පෝෂණය කරනු ඇත. පොළෝ තල වැසියන් සියලු දෙනා එතුමන්ගේ පාලනය පිළිගන්න බැවින්, එතුමන්ගේ සෙනඟ ආරක්ෂා සහිත ව සිටින්නෝ ය. එතුමාණෝ සාමදානය ගෙන දෙන සේක.

*දේව වචනය මෙසේ ය.*

හෝ

## පළමුවන දේව ප්‍රකාශනය රෝම 8: 28–30

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"කලින් තෝරා ගත් අය උන් වහන්සේ කැඳවා ගත් සේක."

තවද දෙවියන් වහන්සේගේ අදහස ලෙස කැඳවනු ලැබූවන්ට, එනම්, උන් වහන්සේට ප්‍රේම කරන අයට, සියල්ලෙහි දී ම උන් වහන්සේ ඔවුන්ගේ යහපත පිණිස ක්‍රියා කරන බව අපි දනිමු. මන්ද, උන් වහන්සේ කලින් තෝරාගත් අය ස්වකීය පුත්‍රයාණන්ගේ ස්වරූපයට සමාන වන පිණිස කල්තියා වෙන් කරගත් සේක. එසේ කෙළේ තමන් වහන්සේගේ පුත්‍රයාණන් බොහෝ සොහොයුරන් අතර ජ්‍යෙෂ්ඨයාණන් වන පිණිස ය. එසේ, කලින් තෝරාගත් අය උන් වහන්සේ කැඳවා ගත් සේක: කැඳවාගත් අය උන් වහන්සේ දමිටු බවට පැමිණෙවූ පැමිණෙවූ සේක: දේව සබඳතාවට පැමිණෙවූ අය උන් වහන්සේ මහිමයට පැමිණෙවූ සේක.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 13: 5–6

පිළිතුර : මම සමිඳුන් කෙරෙහි බොහෝ ප්‍රීති වන්නෙමි.

ගීය : ඔබේ තිර පෙමෙහි මම රඳා සිටිමි.
ඔබ මා ගැළෙවූ බැවින් මම ප්‍රීති වන්නෙමි.

සමිඳුන් දයා කරුණා පෑ බැවින්
එතුමන් හට මම ගී ගයන්නෙමි.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
කන්‍යා මරියාවෙනි, ඔබ ආසිරි ලද්දී ය.
සකල ප්‍රශංසාවට හේතු වන්නී ය.
මක්තිසාදයන් ඔබගෙන් අපගේ දෙවියන් හා
ධර්ම සූර්යයාණන් වන ක්‍රිස්තුස් වහන්සේ උපන්නා හ.
ආලේලූයා!

## සුවිශේෂය මතෙව් 1: 1–16, 18–23 හෝ 1: 18–23

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ඈ පුතෙකු බිහි කරන්නී ය. උන් වහන්සේට
ජේසුස් යන නාමය තැබිය යුතු ය."

(ආබ්‍රහම්ගේ ද දාවිත්ගේ ද පුත්‍ර වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ වංශාවලිය මෙසේ ය. ආබ්‍රහම්ට දාව ඊසාක් ද, ඊසාක්ට දාව ජාකොබ් ද, ජාකොබ්ට දාව ජුදා ඔහුගේ සහෝදරයෝ ද උපන්හ. ජුදාට දාව තාමාර්ගෙන් පෙරෙශ් හා ශෙරා ද, පෙරෙශ්ට දාව හශ්රොන් ද, හශ්රොන්ට දාව ආරාම් ද, ආරාම්ට දාව අම්නාදාබ් ද, අම්නාදාබ්ට දාව නාෂොන් ද, නාෂොන්ට දාව සල්මොන් ද, සල්මොන්ට දාව රාහාබ්ගෙන් බෝවස් ද, බෝවස්ට දාව රූත්ගෙන් ඕබෙද් ද, ඕබෙද්ට දාව ජෙස්සේ ද, ජෙස්සේට දාව දාවිත් රජ ද උපන්නෝ ය.

දාවිත් රජුට දාව උරියාගේ භාර්යාව වී සිටි ස්ත්‍රියගෙන් සලමොන් ද, සලමොන්ට දාව රෙහොබෝවම් ද, රෙහොබෝවම්ට දාව අබියා ද, අබියාට දාව ආසප් ද, ආසප්ට දාව ජෙහොෂාපාත් ද, ජෙහොෂාපාත්ට දාව ජෝරාම් ද ජෝරාම්ට දාව උශ්ශියා ද උශ්ශියාට දාව ජෝතාම් ද, ජෝතාම්ට දාව ආහස් ද ආහාස්ට දාව හෙසකියා ද, හෙසකියාට දාව මනස්සේ ද, මනස්සේට දාව ආමොස් ද, ආමොස්ට දාව ජෝසියා ද බබිලෝනියට විප්‍රවාසගතවීම සිදුවූ මේ කාලයේ දී ජෝසියාට දාව ජෙකොනියා ද ඔහුගේ සහෝදරයෝ ද උපන්නෝ ය.

බබිලෝනියේ විප්‍රවාසයෙන් පසු ජෙකොනියාට දාව ෂෙයල්තියෙල් ද, ෂෙයල්තියෙල්ට දාව සෙරුබාබෙල් ද, සෙරුබාබෙල්ට දාව අබියුද් ද, අබියුද්ට දාව එලියාකිම් ද, එලියාකිම්ට දාව ආශෝර් ද, ආශෝර්ට දාව සාදොක් ද, සාදොක්ට දාව ආකීම් ද, ආකීම්ට දාව එලියුද් ද, එලියුද්ට දාව එලෙයාසර් ද, එලෙයාසර්ට දාව මත්තාන් ද, මත්තාන්ට දාව ජාකොබ් ද, ජාකොබ්ට දාව මරිය තුමීගේ පුරුෂයා වූ ජෝසෙප් ද උපන්නෝ ය: මරිය තුමීගෙන් ක්‍රිස්තුස් නම් වූ ජේසුස් වහන්සේ උපන් සේක.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උපත සිදු වූයේ මෙසේ ය: උන් වහන්සේගේ මෑණියන් වූ මරිය තුමී ජෝසෙප් හා විවාහ ගිවිසගෙන සිටිය දී, ඔවුන් එක් වන්න පෙර, ශුද්ධාත්මයාණන් අනුහසින් ඈ ගැබ්ගෙන සිටින බව දැනගන්නා ලදී.

ඇගේ ස්වාමි පුරුෂයා වන ජෝසෙප්, සත් පුරුෂයෙකු වූ බැවින් ඇය ප්‍රසිද්ධියේ නින්දාවට නොපමුණුවන අදහසින්, රහසින් ඇය අත්හැරදමන්න සිතාගත්තේ ය. එහෙත් ඔහු මේ කාරණය ගැන කල්පනා කරමින් සිටිය දී, සමිඳාණන් වහන්සේගේ දූතයෙක් සිහිනයකින් ඔහුට දර්ශනය වී, "දාවිත්ගේ පුත් ජෝසෙප්, ඔබේ බිරිඳ වන මරියා පාවාගන්නට බිය නොවන්න: මන්ද, ඈ ගැබ්ගෙන ඇත්තේ ශුද්ධාත්මයාණන් අනුහසින්. ඈ පුතෙකු බිහි කරන්නී ය: උන් වහන්සේට 'ජේසුස්' යන නාමය තැබිය යුතුය: මන්ද, සිය සෙනඟ ඔවුන්ගේ පාපවලින් මුදාලන්නේ එතුමාණෝ ය" යි කී ය. මේ සියල්ල සිදුවූයේ සමිඳාණන් වහන්සේ දිවැසිවරයා ලවා කියෙවූ කීම ඉටු වන පිණිස ය. එනම්: "මෙන්න, කන්‍යාවක් ගැබ්ගෙන පුතෙකු බිහි කරන්නී ය: උන් වහන්සේට එම්මානුවෙල් යන නාමය තබනු ඇත," යනු ය. ඒ නාමයේ අර්ථය නම්, "දෙවියන් වහන්සේ අප සමඟ ය" යනුයි.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*